# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2015

### 2020 පෙබරවාරි - අප්‍රේල්

### සමාජීය විද්‍යා පීඨය

## සමාජවිද්‍යාව

### සමාජවිද්‍යාවේ මූලික සංකල්ප SOCI E 1015

ප්‍රශ්න 05 ට පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 8 යි. කාලය : පැය 03 යි.

---

1. සමාජවිද්‍යාව විෂය බිහිවීමට දායක වූ ඓතිහාසික සමාජ පසුබිම විස්තර කොට සමාජවිද්‍යාව සුවිශේෂී විෂයක් ලෙස ස්ථාපිත කිරීමට ඔගස්ට් කොම්ට්ගෙන් ලැබුනු දායකත්වය විස්තර කරන්න.

2. සමාජවිද්‍යාව සහ සමාජ මානවවිද්‍යාව අතර සමානකම් සහ අසමානකම් මොනවාදැයි පැහැදිලි කරන්න.

3. අදාල නිර්වචන ඇසුරු කොට සමාජානුයෝජනය යනු කුමක්දැයි පැහැදිලි කර ප්‍රාථමික සමාජානුයෝජන ක්‍රියාවලියේදී පවුල් සංස්ථාවේ කාර්‍යභාරය පිළිබඳ ඇගයීමක් කරන්න.

4. නිලබල ක්‍රමය යනු කුමක්දැයි හඳුන්වා නිලබල ක්‍රමය පිළිබඳ මැක්ස් වෙබර්ගේ ආකෘතිය කෙටියෙන් පැහැදිලි කරන්න.

5. සමාජ අන්තර්ක්‍රියා යනු මොනවාදැයි පැහැදිලි කර නූතන තාක්‍ෂණික-මාධ්‍ය සමාජ අන්තර්ක්‍රියාවන්ට සිදුකර ඇති බලපෑම සාකච්ඡාවට ලක් කරන්න.

6. සමාජ ස්ථාරායනය යනු කුමක්දැයි නිර්වචනය කර සමාජ ස්ථාරායනය පිළිබද ප්‍රධාන සමාජවිද්‍යාත්මක එළඹුම් මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

7. සමාජ සංස්ථාව යන සංකල්පය පැහැදිලි කර සමාජ සංස්ථාවක් ලෙස ආගම සමාජ ව්‍යුහය සහ සංවිධානය කෙරෙහි කරන බලපෑම ශ්‍රී ලංකා සමාජයට විශේෂිතව සාකච්ඡා කරන්න.

8. පහත සඳහන් මාතෘකාවලින් දෙකකට (02) සටහන් ලියන්න.
   - අ. එමිල් ඩර්කයිම්
   - ආ. සමාජ පාලනය
   - ඇ. තත්වය සහ කාර්‍යභාරය
   - ඈ. සමාජ ජාලය
   - ඉ. කාල් මාක්ස්

**************************